**කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය - 2017**

-------------------------------------------------------------------------

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංර්ධන ව්‍යාපෘතියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව අතර 2012 මැයි 18 දින එළඹි අංක 8145 - එල්.කේ.දරන ණය ගිවිසුමේ 2 උපලේඛනයේ II වගන්තිය (ඕ.3) සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි.

**1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණ,අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය**

-------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, මහනගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර නාගරික සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව සහ කොළඹ මහනගර සභාව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ.කොළඹ ජල ද්‍රෝණිය පෝෂක ප්‍රදේශයේ ජලගැලීම අඩුකිරීමට හා තෝරාගත් ආදර්ශන ආයේජනයන් මඟින් ප්‍රාදේශීය යටිතල හා සේවා පුනරුත්ථාපනය,වැඩිදියුණු කිරීම හා නඩත්තු කිරීම සඳහා කොළඹ අගනගර ප්‍රදේශයේ පළාත්පාලන ආයතනවල ධාරිතාවය ශක්තිමත් කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 42,031.74 කට සමාන එජඩො මිලියන 321 ක් වන අතර ඉන් එජඩො මිලියන 213 කට සමාන රු.මිලියන 27,890.22ක් මුල්‍යායනය කිරීමට ප්‍රතිසංස්කරණය හා සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර බැංකුව එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 ජූලි 10 දින ආරම්භ කරන ලද අතර 2017 ජූනි 30 දින වන විට නිමකිරීමට නියමිත විය. අනතුරුව ව්‍යාපෘති කාල සීමාව 2020 ජූනි 30 දක්වා දීර්ඝකර තිබුණි.

**1.3 මුල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

-------------------------------------------------------------

මෙම මුල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කලමනාකරණයේ වගකීම වේ.

**1.4 විගණකගේ වගකීම**

---------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මුල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්ම වල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මුල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මුල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මුල්‍ය ප්‍රකාශන වල ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මුල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කලමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මුල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි

ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍යයැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත් වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව ,

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යනු ලබන වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව,

(ඇ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයන් විසින් සපයන ලද අරමුදල්වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් වලින් උද්ගත වූ වත්කම් සහ වගකීම්, ණය යටතේ මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඈ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ , එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌණපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තිබුණේද යන බව හා 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව ,

(ඉ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව ,

(ඊ) ණය යටතේ සපයන ලද අරමුදල් , ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(උ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා අනුගමනය කරන ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව,

(ඌ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම්කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(එ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව සහ

(ඒ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින් වලට අනුකූල වූයේද යන බව

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**------------------**

**2.1** **මතය**

**--------**

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2017 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) විශේෂ (ඩොලර්) ගිණුමේ ආරම්භක හා අවසාන ශේෂ සහ එම ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌණපූරණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව්කර තිබුණේද යන බව සහ 2017 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට ශ්‍රී ලංකා මහ බැංකුවේ (ශ්‍රී ලං ම බැ) ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමෙහි දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතින්වලට අනුකූල වී තිබුණු බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

මූල්‍යයනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුල සහ 2017 දෙසැම්බර් 31 දින දක්වා අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | 2017 වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | අරමුදල් උපයෝජනය | | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | සමාලෝචිත වර්ෂය තුල | | 2017 දෙසැම්බර් 31 දින දක්වා | |
| | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන | රු.මිලියන | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන | එ.ජ.ඩො. මිලියන | රු.මිලියන |
| ප්‍ර.සං.ජා.බැ | 213 | 27,890.22 | 3,000 | 14.34 | 2,347 | 87.70 | 12,198 |
| ශ්‍රී ලං ජ | 108 | 14,141.52 | 1,177 | 7.59 | 1,177 | 25.70 | 3,691 |
| එකතුව | 321 | 42,031.74 | 4,177 | 21.93 | 3,524 | 113.40 | 15,889 |

ඉහත තොරතුරුවලට අනුව ණයදෙන ආයතනය විසින් සැපයූ රු.මිලියන 27890.22 කට සමාන එ ජ ඩො මිලියන 213 ක් වූ මුළු වෙන්කිරීමෙන් සියයට 41 නියෝජනය වන රු.මිලියන 12,198 කට සමාන එජඩො මිලියන 87.70 ක් පමණක් ව්‍යාපෘති කාලපරිච්ඡේදයෙන් වසර 5 ½ ක් ඉක්මවීමෙන් පසුව 2017

දෙසැම්බර් 31 දින වන විට උපයෝජනය කර තිබුණි. ඒ අනුව ව්‍යාපෘතිය විසින් සවිස්තරාත්මක ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙල කර නොතිබීම සහ ක්‍රියාත්මක කර නොතිබීම හේතුවෙන් ව්‍යාපෘතියේ ඉතිරි වර්ෂ 3 ½ ක කාල පරිච්ඡේදය තුල එ ජ ඩො මිලියන 125.3 කට සමාන රු.මිලියන 15,692.22 ක ඉතිරි අරමුදල් උපයෝජනය කිරීමේ හැකියාව සැක සහිත බව නිරීක්ෂණය විය.

**3.2 භෞතික කාර්ය සාධනය**

-------------------------

ලබාගත හැකි වූ තොරතුරු අනුව, ගංවතුර හා ජලය බැසයාමේ පද්ධති කලමණාකරණය හා මහ කොළඹ ප්‍රදේශයට අයත් පළාත් පාලන ආයතන වලට සහාය දීම යන සංරචකය යටතේ වැඩසටහන් 56 ක්‍රියාත්මක කිරිමට පියවර ගෙන තිබුණි. මෙම වැඩසටහන් වලට අනුව ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 13,843 කට කොන්ත්‍රාත්තු 44 ක් 2017 දෙසැම්බර් 31 දිනට ප්‍රදානය කර තිබුණි. ඉන් කොන්ත්‍රාත්තු 34 කට අදාල ක්‍රියාකාරකම් සමාලෝචිත වර්ෂය අවසාන වන විට සැලකිය යුතු කාල ප්‍රමාදයකින් යුතුව සම්පූර්ණකර තිබු අතර මෙය ව්‍යාපෘති කාලපරිච්ඡේදය ඉදිරි වසර 03 කින් දිර්ඝ කිරීමට හේතු විය. සමාලෝචිත කාල පරිච්ඡේදය අවසාන වන විට ඉතිරි ඉදිකිරීම් කොන්ත්‍රාත්තු 10 ක භෞතික කාර්යසාධනය සියයට 10 සිට සියයට 87 දක්වා වූ පරාසයක පැවතුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පාරිභෝගික සේවාවන් විතැන් කිරීම හා කොන්ත්‍රාත්කරුවන්ගේ අඩුපාඩුකම් නිසා 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කල යුතුව තිබූ කිංසි පාරේ ජල අපවහන පද්ධතිය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය , දේව් බාලිකාව අසල ජල අපවහන කාණු පද්ධතිය ඉදිකිරිමේ ව්‍යාපෘතිය, මාදිවෙල නැගෙනහිර හා කොලොන්නාව නගර සභා ප්‍රදේශවල සංවර්ධන වැඩකටයුතු වල ප්‍රගතිය, සියයට13 සිට සියයට 90 දක්වා වූ අඩු ප්‍රගති මට්ටමක 2017 දෙසැම්බර් 31 වන විටත් පැවතුණි.

(ආ) ගංවතුර සහ ජලාපවාහන කළමනාකරණ සංරචකය යටතේ හඳුනාගත් රු.මිලියන 14,377 වටිනා ඉදිකිරීම් ව්‍යාපෘති වන අඹතලේ සහ ශාන්ත සෙබස්තියන් දකුණු පොම්පාගාරය, කොලොන්නාව ඇල පුළුල් කිරීම සහ ෆැලැෂින්ගේට් (Flashing Gate) කෝට්ටේ කොටු පවුර ජෛව උද්‍යානය, බේරේ වැව ආශ්‍රිත රේඛිය උද්‍යානය, සෝන්ඩර්ස් පෙදෙසෙහි වැසි ජලය බැස යන කාණු පද්ධතිය සහ නොරිස් ඇලෙහි ප්‍රතිසංස්කරණ කටයුතු සමාලෝචිත වර්ෂය අවසානයේදි ඉදිකර අවසන් කිරීමට අපේක්‍ෂා කලද ප්‍රසම්පාදන ක්‍රියාපරිපාටිය සහ සම්බන්ධිත ආයතන සමඟ මනා සම්බන්දීකරණයක් නොතිබිම හේතුවෙන් 2017 දෙසැම්බර් 31 වන විටත් ඉදිකිරීම් ආරම්භකර නොතිබුණි.

(ඇ) මාදිවෙල නැගෙනහිර දිශානුමුඛ ව්‍යාපෘතියේ (අදියර 1) නිව් ඩ්‍රොප් ස්ට්‍රක්චර් (New drop structure) ඉදිකිරීම සහ ගංවතුර ගේට්ටු (Flood Gate) ඉදිකිරීම 2017 නොවැම්බර් මාසය වන විට ඉදිකර අවසන් කල යුතු වුවද 2018 ජුනි 30 වන විටත් වැඩ අවසන් කොට නොතිබුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

-------------------------------

පොදු ලක්ෂණයක් ලෙස උපදේශකයින්හට නිශ්චිතව සැලසුම් සකස්කල නොහැකිවිම, සැලසුම් වල සහ වැඩ වල විෂය පථය නිරන්තරයෙන් වෙනස්විම, අවිධිමත් ඇස්තමේන්තු පිළියෙල කිරීම වැනි කොන්ත්‍රාත් පරිපාලනයේ පවතින දුර්වලතා සෘජුවම ව්‍යාපෘතිවල අඩු ප්‍රගතිය සහ අරමුණු වලට ලඟාවීම සම්බන්ධයෙන් සෘජුවම බලපෑම් කර තිබුණි. විස්තර පහත පරිදි වේ.

(අ) මාදිවෙල නැගෙනහිර දිශානුමුඛ ව්‍යාපෘතිය - අදියර II හි වැඩිදියුණු කිරීමේ වැඩ, ප්‍රසම්පාදන කටයුතු වලදී ඉල්ලුම්පත්‍ර කැඳවීමේ ප්‍රමාදය නිසා අඩු ප්‍රගතියක් දක්නට තිබුණි. එම නිසා ඉදිකල වැඩ සහ ඉදිකිරීමට ඇති වැඩ අපේක්ෂිත ඉලක්කයට වඩා මාස 05 කට වඩා වැඩි කාලයක් 2017 දෙසැම්බර් 31 දිනට ඉක්මවා ගොස් තිබු අතරම කොන්ත්‍රාත් පිරිවැය

රු.මිලියන 100 වු මුල් ඇස්තමේන්තුව ප්‍රමාණවත් හේතුවක් රහිතව රු.මිලියන 125 දක්වා ඉහල දමා තිබුණි.

(ආ) රු.මිලියන 202 ට පිරිනමා ඇති බේරේ වැව ආශ්‍රිත රේඛීය උද්‍යානය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අදියර 1 හි වැඩ වෙනුවෙන් රු.මිලියන 16.43 ක් ගෙවා තිබුණද ඉදිකළ දැව වැඩ සඳහා දැව පිලිවෙත් සහතික, උද්‍යානය නඩත්තු කිරිම සඳහා වන අත්පොත, බැම්බු ප්ලාස්ටික් සහ ටෙන්සිල් රෙදි සඳහා වගකීම් සහතික ඉදිරිපත් කිරිම සම්බන්ධයෙන් වන කොන්ත්‍රාත්තුවේ අවශ්‍යතා කොන්ත්‍රාත්කරු විසින් ඉටුකර නොමැති බව නිරීක්ෂණය විය.

(ඇ) බේරේ වැව ආශ්‍රිත රේඛිය උද්‍යානය ඉදිකිරීමේදි අමුත්තන් සඳහා වන ආසන ඉදිකිරීමේදි ඒ සඳහා කුඹුක් හෝ තේක්ක දැව භාවිතාකල යුතු බව පිරිවිතරයෙහි දක්වා ඇති අතර ඒ සඳහා රු.මිලියන 7.86 ඇස්තමේන්තු කර ඇත . කෙසේ වෙතත් විගණක විසින් එම අමුත්තන් සඳහා වන ආයතනයකින් ලබාගත් සාම්පලයට අදාල ස්වාධින රසායනාගාර පරීක්‍ෂණ වාර්තාව අනුව එම අයිතම පිරිවිතරයන් සමඟ නොසැසෙදෙන බවත් වෙනත් දැව වර්ගයකින් නිමකර ඇති බවත් තහවුරු විය.

(ඈ) දේව්බාලිකා විද්‍යාලය අසල අපවහන කාණු පද්ධතිය ඉදිකිරිමේ කොන්ත්‍රාත්තුව භෞතිකව පරිකෂා කිරිමේදි ඉදිකිරිම් සඳහා භාවිතා කල පෙරසවි කොන්ක්‍රීට් අයිතම බිම් ඇතුරුම්ගල්, යකඩ බාර් අදාල ගුණාත්මකව අවශ්‍යතාවන්ට නොගැලපෙන බව අනාවරණය වු අතරම ගුණත්වය තහවුරු කිරිම සඳහා ක්‍රමවේදයක් භාවිතා නොකර තිබු අතර පෙර සවි කොන්ක්‍රිට් ඇතිකිරිමට පෙර රු.මිලියන 52.62 ක් ගෙවා තිබු බව තවදුරටත් නිරීක්‍ෂණය විය.

(ඉ) ඉකුත් වර්ෂයේ මාගේ වාර්ථාවේ සඳහන් කළ පරිදි බැද්දගාන ජෛව විවිධත්ව උද්‍යානයේ ඉදිකිරිම් වලට සහ ප්‍රදේශයට ඉකුත් ඇතිවිය හැකි ගංවතුර අවදානම් සහ පාරිසරික බලපෑම අවම කිරිම සඳහා කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබිණි . තවද විධිමත් අධ්‍යයනයකින් තොරව ප්‍රමාන පත්‍ර සහ ඉංජිනේරු ඇස්තමේන්තුව පිළියෙල කිරීමත් කලවැඩ සඳහා නිවැරදි නොවන ගණනය කිරිම් නිසාත් කොන්ත්‍රාත්කරුට වැඩිපුර ගෙවු රු.මිලියන 92 ක් අයකරගෙන නොතිබුණි.

(ඊ) මට්ටක්කුළිය වෙරළ උද්‍යානය ඉදිකිරීම සඳහා 2014 සැප්තැම්බර් 23 දින රු. මිලියන 275 ක ඇස්තමේන්තු ගත මුදලකට කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණු අතර එය 2015 ජුලි මාසයේ නිම කිරීමට අපේක්‍ෂා කරන ලදි. කෙසේ වෙතත් කොන්ත්‍රාත්තුවේ වැඩ කොන්ත්‍රාත්කරුගේ දුර්වලතා නිසා 2016 දෙසැම්බර් 31 දින අවසන් වී ඇති බව වැඩබිම පරීක්‍ෂාවේදි තහවුරු විය. සමාලෝචිත වර්ෂය අවසන් වන විට රු.මිලියන 183 ගෙවා තිබුනද කොන්ත්‍රාත් ගිවිසුමේ ප්‍රමාන පත්‍රයේ ඇතුලත් අයිතම 47 ක් 2017 දෙසැම්බර් 31වන විටත් අවසන්කර නොතිබුණි.

(උ) ලැබුණු තොරතුරු අනුව ව්‍යාපෘතිය විසින් ඇස්තමේන්තු ගත පිරිවැය රු.මිලියන 5,106 වටිනා කොන්ත්‍රාත් 19 ක් 2017 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.මිලියන 4,404 කට නිමකර ඇති අතර ව්‍යාපෘතිය විසින් යථාරූපි නොවු පිරිවැය ඇස්තමේන්තු පිළියලකර ඇති බවට මෙය සාක්‍ෂි දරයි.

(ඌ) ව්‍යාපෘතිය විසින් සේවයේ යොඳවා ඇති දේශිය උපදේශකවරුන්ගේ බහුතරයක් ගිවිසුම්ගත කොන්දේසිවලට (TOR) පටහැනිව ඉදිකිරිමේ කාර්යයන් සඳහා සම්බන්ධවනවා වෙනුවට පරිපාලන කාර්යයන් සඳහා දායක වන බව කල වැඩ වාර්ථා සම්බන්ධයෙන් සිදුකරනු ලැබු නියැදි පරිකෂා කිරිමේදි අනාවරණය විය. කාර්ය සාධන ඇගයීමකින් තොරව උපදේශකවරුන් 03 ගේ සේවා කාලය 2017 අගෝස්තු මාසයේ සිට තවදුරටත් වසර 03 කින් සියයට 10ක වාර්ෂික වැටුප් වර්ධකයන් සමගින් දිර්ඝකර තිබුණි.

**3.4** **මානව සම්පත් කලමනාකරණය**

----------------------------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) ජ්‍යෙෂ්ඨ ඉංජිනේරුවන් සහ තාක්ෂණික නිලධාරින් වැනි ව්‍යාපෘතියේ ප්‍රධාන තනතුරු ඇතුළුව පුරප්පාඩු 70 ක් වසර පුරා පැවති බවත් එය ව්‍යාපෘති කටයුතුවල සුමට ක්‍රියාකාරිත්වයට අහිතකර ලෙස බලපා ඇති බවත් නිරීක්ෂණය විය.

(ආ) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ ඉංජිනේරුවන් 18 ඇතුලුව නිලධාරින් 50ක් ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන කොන්ත්‍රාත් කටයුතු සඳහා සේවයේ යොදවාගෙන ඇති අතර ඔවුනට 2017 ජනවාරි සිට 2018 මැයි දක්වා රු.මිලියන 32.6 ක් සංස්ථාව විසින් ගෙවීම්කර තිබුණි. ඊට අමතරව උපදේශකවරුන් දෙදෙනෙක් බඳවාගෙන තිබූ අතර සමාලෝචිත වර්ෂය තුලදී රු.මිලියන 2.8 ගෙවීම්කර තිබුණි. කෙසේ වෙතත් ඔවුන්ගේ කාර්යභාරය ඇගයීමට හැකි අයුරින් රැකියා විස්තර ඉදිරිපත්කර නොතිබුණි.

**3.5** **මතභේදාත්මක ගනුදෙනු**

---------------------------

පහත දැක්වෙන නිරීක්ෂණයන් සිදුකරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය විසින් මෝටර් රථ සහ ද්‍රව්‍ය ගබඩාකිරීම සඳහා මට්ටක්කුළිය ප්‍රදේශයේ පර්චස් 260 ඉඩම් කැබැල්ලක් භාවිතාකර තිබූ අතර මේ සඳහා 2017 අගෝස්තු සිට 2018 ජූලි දක්වා රු.මිලියන 12.1 ගෙවීම්කර තිබුණි. කෙසේ වෙතත් මට්ටක්කුළිය මුතුවෙල උමඟ ආශ්‍රිත වැඩ 2018 ජූලි 31 දින වන විටත් ආරම්භකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී ව්‍යාපෘතියේ අරමුණු ළඟාකරගැනීමට අදාල නොවන රු.මිලියන 4.28ක් සමරුඵලක ස්ථාපිත කිරීමට සහ උත්සව විවෘත කිරීමේ වියදම් සඳහා දරා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මෝටර් රථ 05ක් කුළියට ගැනීම සඳහා ව්‍යාපෘතිය විසින් රු.මිලියන 5.5 වියදම්කර ඇති බව නිරීක්ෂණය විය. මසකට කිලෝමීටර් 2000 ක් ධාවනය කල යුතු වුවද සමාලෝචිත වර්ෂය තුල වාහනයක මාසික සාමාන්‍ය ධාවනය කිලෝමීටර් 549 ක් දී තිබුණි. අංක 01/2016 සහ 2016 මාර්තු 24 දිනැති කලමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව එම වාහන නිලධාරින් 05ට වෙන්කර තිබුණි.

**3.6** **මූල්‍ය පාලනයේ දුර්වලතා**

--------------------------

ව්‍යාපෘතිය විසින් 2017 දෙසැම්බර් 31 දිනට මිලදීගත් පිරිවැය රු.මිලියන 1,940 ක් වූ වත්කම් වාර්තා කිරීම සඳහා ව්‍යාපෘති වාර්තාවේ ඡේද අංක 42 ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනයක් සකස්කර නොතිබුණි.